අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord.Level) Examination, 2023(2024)

සිංහල සාහිත්‍ය රසාස්වාදය	**I, II**
இலக்கிய நயம் சிங்களம்	**I, II**
Appreciation of Sinhala Literary Texts	**I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் – 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකය : .....

උපදෙස්:

(i) I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී වෙන වෙන ම භාරදිය යුතු ය.

(ii) I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතු ය.

(iii) II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.

(iv) I පත්‍රය සඳහා ලකුණු 40ක් ද II පත්‍රය සඳහා ලකුණු 60ක් ද හිමි වේ.

සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

(සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න).

01. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒ ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු, දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) "බිසවුන් වහන්සේ තනි ව වැඩ සිටිනා සෙයින් වැද්ද නොහෙමි."

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.....

(ii) "මෙතෙක් බර උසුලා ගෙන දවස කෙතෙක් තැන් යවූ දැ"

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

.....

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.....

(iii) "පියරු දැම්මට මුහුණේ ගඳ යනවා ද?"

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....

(ආ) මෙම ප්‍රකාශය කළේ කාහට ද?

.....

(i) තිරසර ගුණෙන් යුතු උතුමකුහට පවර
සමුදුර සියල් කිඳලෙක තුඹසෙක සුනෙර
පුවතර මෙ දඹදිව මළුවෙක සිය ගෙදොර
ඔහුකර නො වන සැපතෙක් එබැවින් කවර

(අ) මෙම කවියේ මුල් පද දෙකෙහි අදහස ලියන්න.

.....

.....

.....

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

පුවතර .....

ඔහුකර .....

(ii) කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලොසබා දහම්
'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

(අ) මෙම පැදි පෙළ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....

(ආ) '' 'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නැ' කියා....." යන පද්‍ය පාඨයෙහි අදහස ලියන්න.

.....

.....

02. පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

2. එසඳ මහාබෝධිසත්ත්වයෝ එසත් රජුන් අල්වා ඔවුනොවුන්ගේ උතුරු සළුවෙන් පිටිතල අයා බැඳගෙන ඒ රණ භූමියෙන් නොයෙක් ජයඝෝෂා පවත්වා ගෙන මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන් දිවිදළන් ඔප් නගා කරන ලද ස්වර්ණ ප්‍රතිමාවක් මෙන් විරාජමාන ව අනන්‍ය සාධාරණ ශ්‍රී විභූතියෙන් යුක්ත ව සුරසෙන් පිරිවරා සුජාතාවන් හා ඓරාවණ වාහනාරූඪ ව අසුර විජය කොට අවුත් වෛජයන්ත ප්‍රාසාදයට වදනා ශක්‍රදේවේන්ද්‍ර විලාසයෙන් මාළිගාවට වැද මදු රජ්ජුරුවන් දැක "මයිලණුවන් වහන්ස, නුඹ වහන්සේට විරුද්ධ ව අවුදින් නුවර වටලාගත් ශත්‍රු සේනාව මථනය කොට රජ දරුවන් සත් දෙනා ජීවග්‍රාහයෙන් අල්වා ගෙන ආමි, මොවුන් මරතත් මැරුව මැනව, හරිතන් හලමැනව, වහල්මේ ගනිතත් ගත මැනව, කැමැත්තක් කළ මැනවැ" යි කීහ.

එබස් අසා මදුරජ්ජුරුවෝ "මහරජ්ජුරුවන් වහන්ස අප ඇම දෙනාට ම ප්‍රධාන ව සිටි හෙයින් මොහු නුඹ වහන්සේට ම සතුරෝ ය. මරතත් තබතත් අරිතත් නුඹ වහන්සේට ම කැමැත්තක් කළ මැනවැ" යි කීහ. මදුරජ්ජුරුවන් විසින් මෙලෙස කී කල්හි මහා බෝධිසත්ත්වයෝ "මොවුන් මරා ලබන්නේ කිම් ද, මුන් හැම මේ නුවරට ආ ගමන් ව්‍යර්ථ නො වේවයි, ප්‍රභාවතීන්ගේ නගුන් සත් දෙනා රජදරුවන් සත් දෙනාට දෙවා ලමි" සිතා "දේවයන් වහන්ස, දිව්‍යාප්සරාවන් සමාන රූප ශෝභා ඇති නුඹ වහන්සේගේ දුන් සත් දෙනා මෙරජ දරුවන්ට පාවා දී මුන් හැම බෑණ කොට ගත මැනවැ" යි කිවූ ය. එබස් අසා මදු රජ්ජුරුවෝ මහා රජ්ජුරු වහන්ස, අපටත් උන්ටත් නුඹ වහන්සේ ම ප්‍රධාන සේක. ඉදින් කැමති සේක් වී නම් දෙවා වදාළ මැනවැ" යි කිවූ ය.

I. මේ උද්ධෘතයේ ඇතුළත් උපමා දෙකක් උපුටා දක්වන්න.

.....

.....

II. මහා බෝධිසත්ත්වයන් සත් රජවරුන් අල්වා ගැනීමෙන් අනතුරුව කළ කාර්යය කුමක් ද?

.....

.....

III. මහා බෝසතාණන් තමා අල්වා ගෙන පැමිණි රජදරුවන් සත් දෙනා සම්බන්ධයෙන් මදු රජුට කළ ප්‍රකාශයත් එයට මදු රජු දුන් පිළිතුරත් විස්තර කරන්න.

.....

.....

.....

.....

.....

.....

IV. අවසානයේ සත් රජවරුන් සම්බන්ධයෙන් මහා බෝසතාණන් කළ යෝජනාවත් එයට මදුරජුගෙන් ලැබුණු ප්‍රතිචාරයත් ලියන්න.

.....

.....

.....

.....

නැතහොත්

වැහි වලා කුළ, පෑ කළු යැ යි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නොසතොස් නොවන්
සිරුරු පෑයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්,
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්,
කුඹුරු - වැව්-පොකුණුත් පුරවා දියෙන්,
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

නද අසා ඔබ ගේ පැහැයත් බලා,
මොනරු පිල් විදහා රහ දෙත් නදින්.
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
තුරු ලියත් ලිය -ලයි සැනැසී දියෙන්.

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි; ඔබ යෑම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෙ'ව පවතිත් නිතින්.

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලොඋ සබා දහම්
'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නෑ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

(i) වැහි වලා කුළ සොබා දහමේ පැසසුමට ලක් වන්නේ කවර ආකාරයෙන් ද?

.....

.....

(ii) උතුමන් හා වාසයෙන් නිවටයන් ද උසස් වන බව දැක්වීමට කවියා යොදා ගෙන ඇති යෙදුම කුමක් ද?

.....

(iii) තද කළු අකුරින් මුද්‍රිත පද්‍යයෙන් ඇඟවෙන අදහස කෙටියෙන් විස්තර කරන්න

.....

.....

(iv) කළු පැහැය පිළිබඳ ව සමාජයේ පවතින ආකල්ප අර්ථශූන්‍ය බව දැක්වීමට කවියා උත්සාහ ගෙන ඇති අයුරු කෙටියෙන් විස්තර කරන්න

.....

.....

.....

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord.Level) Examination, 2023(2024)

සිංහල සාහිත්‍ය රසාස්වාදය	**I, II**
இலக்கிய நயம் சிங்களம்	**I, II**
Appreciation of Sinhala Literary Texts	**I, II**

සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය ද, 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

1. පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් කරන්න.

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා — සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට — පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ — මිස
එ සඳ ඔබේ මුව‘ග නැගුණු සාද තෙපුල් නෑසේ — මට

මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයා දී — රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය — ඔබ

බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබි එබී — බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා — නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඩුලු මැදින් ආ — ගමනේ
මහදේ ඇදි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි — නොදැනේ

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා — සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගෙන් — අවසර?

(අ) මේ පැදිපෙළට පාදක වූ අත්දැකීම

(ආ) ඒ අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් අවස්ථා

(ඉ) භාෂා භාවිතය

(ඊ) පුද්ගල වර්යා නිරූපණය

(උ) මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති වෙනත් කරුණු

02. පාඨක සිත් බැඳගන්නා ලෙස සිද්ධි පෙළ ගැස්වීමට සද්ධර්මරත්නාවලි කතුවරයා දක්වන කුසලතාව නන්ද මහා තෙරුන්ගේ වස්තුවෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

03. තුංමං හංදිය නවකතාවේ අබිලිංගේ චරිතයෙන් හෙළි වන්නේ ගැමියන්ගේ නිර්ව්‍යාජ සිතුම් පැතුම් ය. උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.

04. "වැලපීම" කෙටිකතාව නිර්මාණය කිරීමේ දී තේමාවට උචිත පරිසරයක් යොදා ගැනීම එහි සාර්ථකත්වයට හේතු වී ඇත. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.

05. මුල් කවි පද දෙකෙහි ප්‍රකාශිත සදුපදේශය වඩාත් තහවුරු කර දැක්වීමට ඉතිරි පද දෙක යොදා ගැනීම සුභාෂිතයේ දක්නට ඇති විශේෂ ලක්ෂණයකි. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.